ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකාවේ තරුණ දේශපාලන නායකයන්ගෙන් සමන්විත දූත පිරිසක් ඉන්දීය සංචාරයක නිරත වේ</u>**

විවිධ දේශපාලන පක්ෂ 14ක තරුණ දේශපාලන නායකයන් 24 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් 2025 ජූලි 14-25 දිනවල ඉන්දියාවේ සංචාරයක නිරත විය. මෙම දූත පිරිසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, හිටපු පළාත් සභා නියෝජිතයන්, පළාත් පාලන ආයතනවල සාමාජිකයන් සහ තරුණ සංවිධානවල නායකයන් ඇතුළත් විය.

2. දෙරට අතර විවිධ මට්ටමේ සබඳතා තර කරමින් දේශපාලන පක්ෂ භේදයකින් තොරව බැඳීම් ශක්තිමත් කිරීමේ අරමුණින් සිදු වූ මෙම සංචාරය රටවල් දෙක අතර එම ආකාරයේ ප්‍රථම වැඩසටහන විය. දිල්ලි ජාතික අගනුවර කලාපය සහ බිහාර් සහ කර්ණාටක ප්‍රාන්ත කේන්ද්‍ර කරගනිමින් සිදු වූ මෙම සංචාරයේදී ශ්‍රී ලංකා දූත පිරිසට ඉන්දියාවේ සංවර්ධන මුලපිරීම්, ආර්ථික නවීකරණය, තාක්ෂණික දියුණුව, ප්‍රජාතාන්ත්‍රීය සම්ප්‍රදායන් සහ පොහොසත් සංස්කෘතික උරුමය දැකබලා ගැනීමේ අවස්ථාව හිමි විය.

3. ශ්‍රී ලංකා දූත පිරිස දිල්ලියේදී විදේශ ලේකම් ශ්‍රී වික්‍රම් මිස්රි මහතා හමු වූ අතර එහිදී එතුමා ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වයේ අනාගත මාර්ග සිතියම සවිමත් තාක්ෂණික, ආයෝජන සහ සම්බන්ධකතා බැඳීම් මත පදනම් වනු ඇති බව ප්‍රකාශ කළේය. ‘අසල්වැසියා ප්‍රථමයෙන්’ යන ප්‍රතිපත්තිය සහ ‘මහාසාගර්’ (MAHASAGAR) යන දැක්ම යටතේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහ ප්‍රගතියට ඉන්දියාවේ කැපවීම එතුමා අවධාරණය කළේය.

4. දූත පිරිස ඉන්දීය පාර්ලිමේන්තුව වෙත ගිය අතර එහිදී ව්‍යවස්ථාදායක ක්‍රියාවලින්, පාර්ලිමේන්තු කමිටු ක්‍රියාවලීන් වැනි කරුණු පිළිබඳව අන්තර්ක්‍රියාකාරී සැසි සඳහා සහභාගී වූහ. ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ව්‍යවස්ථාදායක සභා සාමාජිකයන් සහ තරුණ නායකයන් සමඟ අන්තර් ක්‍රියා කිරීමේ අවස්ථාව ද ඔවුන්ට හිමි විය. දූත පිරිස බිහාරයේ සහ කර්ණාටකයේ ආණ්ඩුකාරවරුන් ද හමු වූහ.

5. මෙම දේශපාලන නියැලීම්වලට අමතරව දූත පිරිස Maruti Suzuki, BOSCH India සහ Ather Energy කර්මාන්ත ශාලාවල නිරීක්ෂණ චාරිකාවන්හි නිරත වෙමින් ඉන්දියාවේ නිෂ්පාදන ක්ෂේත්‍රය පිළිබඳව අදහසක් ලබා ගත්හ. ඉන්දියාවේ අනන්‍ය හඳුනාගැනීමේ අධිකාරියේදී (UIADI) ඩිජිටල් පොදු යටිතල පහසුකම් පිළිබඳ ඉන්දියාවේ සාර්ථකත්වය විස්තර කරන ලදි. IIT දිල්ලි සහ නව දිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්ව විද්‍යාලය, බිහාරයේ නාලාන්දාවේ නාලන්දා විශ්ව විද්‍යාලය, කර්ණාටකයේ බෙංගලාරුහි ඉන්දියානු විද්‍යා ආයතනය (IISc) සහ ඉන්දියානු අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය (ISRO) යන ආයතනවල සිදු කරන ලද සංචාරයන්හිදී අධ්‍යාපන සහ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයන්හි දියුණුව ප්‍රදර්ශනය කරන ලදී. ඉන්දීය කර්මාන්ත මණ්ඩලය (CII) විසින් නව දිල්ලියේ දී දූත පිරිස සඳහා ව්‍යාපාරික වටමේස සාකච්ඡාවක් ද පවත්වන ලදී.

6. අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ විද්වත් මණ්ඩල සමඟ පැවති අන්තර් ක්‍රියාවන්හිදී ඉන්දීය ආර්ථිකය සහ විකසනය වන විදේශ ප්‍රතිපත්තිය, ඩයස්පෝරාවේ භූමිකාව, ඉන්දියාවේ සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය මෙන්ම අන්තර්ග්‍රහණීය සහ තිරසාර සංවර්ධනය සඳහා ඉන්දියාවේ මාර්ග සිතියම පිළිබඳව ද වැදගත් කරුණු කාරණා ඉදිරිපත් විය. දූත පිරිස බුද්ධ ගයාවේ පිහිටි ඉන්දීය කළමනාකරණ ආයතනයේදී (IIM Bodhgaya) පොදු ප්‍රතිපත්ති, පාලනය සහ නායකත්වය පිළිබඳ විශේෂ සැසියකට ද සහභාගී වූහ. දූත පිරිස දෙරට අතර ඓතිහාසික බෞද්ධ සබඳතා අවධාරණය කරමින් බුද්ධ ගයාවේ මහාබෝධි විහාරය ද වැඳ පුදා ගත්හ.

7. විවිධ මානයන් රැසක් ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ තරුණ නායකයන් සඳහා පැවති මෙම සංචාරය සඳහා සහයෝගය ලබා දෙන ලද්දේ සංස්කෘතික සබඳතා සඳහා ඉන්දීය කවුන්සිලය (ICCR) සහ නව දිල්ලියේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසිනි. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතා විසින් 2025 අප්‍රේල් මස සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී ශ්‍රී ලාංකීය වෘත්තිකයන් සඳහා විශේෂයෙන් සැකසූ අවස්ථාවන් 700ක් වාර්ෂිකව ලබා දෙන බවට කළ නිවේදනයෙන් අනතුරුව මෙම සංචාරය සිදු කරන ලදී. මෙම වැඩසටහන ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වයේ අසීමාන්තික විභවතාවය සාක්ෂාත් කරගැනීමෙහිලා ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස තරුණ නායකයන්ගේ භූමිකාව අවධාරණය කළේය.

***

**කොළඹ**

***2025* ජූලි *28***